44 වන පිටෙන්

ලංකාදීප පුවත්පතේ උප කර්තෘවරයෙකු වශයෙන් තමන්ට රැකියාවක් ලැබුණු බව මෑතක හදිසියේ කොතැනකදී හෝ හමුවූ ජගත් මා සමඟ පැවසීය. මගේ රැකියාවද පදිංචියද වෙනස්වීමෙන් පසු ජගත් සහ මා අතර පැවති ඇසුර නැවත නැවත බිඳ වැටී තිබුණි. ජගත්ගේ මරණය මා දැනගත්තේ වෙබ් පුවතක් මගිනි. මා එම පුවත කියවන විටත් ඔහුගේ අවසන් කටයුතු සමාප්තව තිබුණේ ඔහු විසින් සිය මරණය උදෙසා පිළිපැදිය යුතු ආකාරය දක්වමින් පවුලේ සමාජිකයන්ට සිදුකරනු ලැබ තිබූ ආමන්ත්‍රණයක් හේතුවෙනි. ජගත් එමගින් දැඩිව ඉල්ලා තිබුණේ රේරුකානේ චන්දවිමල හිමියන්ගේ අවසන් කැමැත්තෙන් ප්‍රකාශිතව තිබූ ඉල්ලීමට සමාන ඉල්ලීමකි. (එය මෙහි අවසානයේ දැක්වේ.)

ඒ ආකාරයෙන්ම නොවූවත් මියගිය දිනම ඔහුගේ අවසන් කටයුතු සිදුකිරීමට පවුලේ සාමාජිකයෝ කටයුතු කරනු ලැබ තිබිණ. එහෙයින් ජගත්ගේ අවසන් මොහොතට සම්බන්ධවී මොනව මොනවා හෝ කතා කිරීමට ඔහු නියෝජනය කළ බොහෝ සමාජ කුලකවල බොහෝ පැරණි මිතුරු මිතුරියන්ට අවස්ථාව ලැබුණේ නැත. ඒ අඩුව පිරිමසා ගැනීමට දෝ පුවත්පත් කිහිපයක ඔහුගේ මරණය පිළිබඳ යම් යම් අකාරයේ සටහන් තබා තිබෙනු පමණක් දැකිය හැකිවීය.

ජීවිතයේ අවසාන අවධියේ පවා පළපුරුදු මාධ්‍යවේදියෙකු වූ ජගත්ට ඇඟළුම් ක්ෂේත්‍රයේ නවක තරුණියක ලබන වැටුපටත් අඩු වැටුපක් ගෙවමින් ඔහුගේ ශ්‍රමය සූරා කෑ පුවත්පත් ද ඒ අතර විය.

## නිවසේ තබා තිබූ අවසන් කැමත්ත පිළිබඳ සංක්ෂිප්ත සටහන

### මා මළ විට මෙසේ කළ මැන.

මා කොහොම මැරේවිදැයි දන්නේ නැහැ. කොහොම මැරුනත් මගේ මරණෙට කළ යුතු දේ මා මේ විදිහට ලියා තියනවා. කරුණාකරලා මේක මේ විදිහටම කරන්න කියලයි මා ආයාචනා කරන්නේ.

මා හිතනවා මැරුනයින් පස්සෙවත් මගේ කැමැත්තට ඉඩක් ලැබේවි කියලා.

1. ගෙදරදී මැරුනොත් මුලින්ම ග්‍රාම සේවක සහතිකය ගන්න.

2. ලඟම තියෙන මල් ශාලාවට දුරකථන ඇමැතුමක් දෙන්න.

3. ඒ කට්ටිය ආවහම මගේ මළකුණ වහාම අරන් යන්න කියන්න. අරන් ගිහින් ඇඳන් හිටපු ඇඳුම් පිටින්ම භූමදාන කරන්න කියන්න. නැතිනම් ආදාහනාගාරයක දවන්න කියන්න.

මගේ මළකුණ බලන්න කවුරුවත් මල් ශාලාවට යන්න ඕන වෙන්නෙ නෑ. මළ මිනියට අන්දන ඇඳුම් අන්දවලා මල් ශාලාවේ පෙට්ටියක තියන්න එපා. ගෙදර කට්ටිය කවුරුත් මගේ භූමදානය හෝ ආදාහනය බලන්න යන්නත් එපා. ගෙදරින් මළකුණ ගෙනිච්චාට පස්සෙ වැඩේ ඉවරෙටම ඉවරයි කියලා හිතාගන්න. වැඩේ ඉවර වුනාම අපේ ගෙවල් වල කට්ටියට කියන්න.

මරණේ තියා නොගත්ත අපවාදෙන් බේරෙන්න මේ රාමු කරපු ලියැවිල්ල දොස් කියන කට්ටියට පෙන්වන්න.

මරණෙට ප්‍රසිද්ධිය ඕනේ නෑ. කොළ අච්චුගැහිලි, තොරංබැඳිලි, පත්තරේ දැමිලි, බැනර් ආදිය කිසිවක්ම එපා. ආරංචි වෙලා ආපු කට්ටියට පුංචි පහේ සංග්‍රහයක් කරන්න. දාන දෙන්න ඕනේ නෑ. මොකද මට පිං කිසිවක් ඕනේ නැති නිසා. කාටවත් කාගෙවත් පිං දෙන්න බෑ. තම තමන් කර කියා ගත්ත දෙයක් විතරයි ඉතිරි වෙන්නේ. පිං අනුමෝදන් කරනවාය කියන කතාවත් බුදු හාමුදුරුවෝ කියූ කතාවක් නොවේ. මිහිඳු හාමුදුරුවෝ අශෝක රජ්ජුරුවන්ගේ බුද්ධාගම ලංකාවට අරන් එනකොට ලංකාවේ ජනතාව අදහමින් හිටියේ මළවුන්. ඒක කරනවාට වඩා පින් අනුමෝදන් කිරීම හොඳයි කියලා උන්නාන්සේ හඳුන්වලා දීපු පාර තමයි මේ කට්ටිය පින් අනුමෝදන් කරන්නේ.

රේරුකාණේ හාමුදුරුවෝ කියනවා වගේ මළාට පස්සේ දර කෑල්ලක් තරංවත් වටින්නේ නැති මළකුණ ගෙදර තියාගෙන උත්සව පවත්වන මෝඩයන්ටයි මේ කියන්නේ. දෙයියො ගැන මට කිසි විශ්වාසයක් නෑ. දවස් හතෙන් කරන, තුන් මාසෙන් කරන, බණ දේශනා, හාමුදුරුවෝ ගෙන්වීම්, පිංකම්, මොකවත් එපා. ජීවත් වෙලා ඉන්නකම් මා දාන මාන දීලා තියෙනවා. ඒවා පිං බලාගෙන කරපුවා නෙවෙයි. මනුස්සකමේ නාමයෙන් කරපුවා. පින් දෙන්නත් බෑ. පින් ගන්නත් බෑ. සංසාරේ තියේ නං ඒ චක්කරේ ඕන තැනක් මට ඔට්ටුයි. අද තියෙන ලෝකෙ වෙන කොහේවත් නැති සිංහල බුද්ධාගමට මම කැමැතිත් නෑ. බුදු හාමුදුරුවෝ ලංකාවට ආවෙත් නෑ. ඒක මහාවංශෙ ලියපු මහානාම හාමුදුරුවෝ ලංකාවේ යශෝරාවය පිණිස ලියූ සාහිත්‍ය පරිකල්පන මායාවක්.

කොහොම වුනත් මළ විට මගේ මරණය කිසිවෙකුට කරදරයක් කරන්න එපා.

මෙයට
ආදරණීය

ජගත් රණතුංග

වයස අවුරුදු 56 දී, ඉපැදුණේ 1959 ජුනි 14 දා සටහන තබා අත්සන් කෙළේ - 2014.ඔක්.27

\- ශ්‍රීලාල් සෙනෙවිරත්න

**Office/Shop Space for Sale**
in Ja-Ela (Orex City)
================================
Orex city shopping complex shop
no 333 [2nd floor of Cargills Building]
Office/Shop space for sale

**ජා ඇල ඒකල**

Orex City Shopping Complex.
No .333.

**කඩ කාමරය විකිණීමට**

**ව්‍යාපාරික හෝ කාර්යාලයක් ලෙස**

**ජල විදුලිය** Attached Toilet
**ව්‍යාපාරික ස්ථානය ටයිල් කර ඇත**
**ඉදිරිපස ටෙම්පර්ඩ් ග්ලාසස්**
**වර්ග අඩි 189**
**විදුලි සෝපාන**
**රථගාල පහසුකම**

Price: 16500 AUD
Contact Telephone: +61438038624

**Mariane Fernando**
**Member ACA & Counsellors Victoria Inc.**
**Trained by Transgender Victoria**

Offering counselling services for:
• Relationship • Addiction
• Grief and loss • Family
• Anger management
• Anxiety and stress

**First session free**

Medibank Private Health Fund rebates may be available

**9798 7005 or 0423 364 618**